# අනන්තය





ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න

## කවුද කියන්නේ මට කලාව ගැන දැනුමක් නෑ කියලද?

එදා ආනන්දයෙන් තමා ප්‍රධාන වාමාංශික නායකයෝ ඔක්කොම වගේ බිහි වුණේ එන්.එම්., පිලිප්, බර්නාඩ් මෙන්ම කරාලසිංහමුත් මේ පාසලෙන් බිහි වුණ අයයි. ඒ වගේ දේශපාලන නායකයෝ විතරක් නෙවෙයි, වාමාංශික සාහිත්‍යකරුවන්, විවිධ ක්ෂෙත්‍රවලට වමේ අදහස් ගෙන ගිය බුද්ධිමතුන් අතරින් සෑහෙන කොටසක් ආනන්දයේ ආදි සිසුන්. මං ආනන්දයේ ඉන්න කාලේම තමා ගෝමීන්ද්‍රාස් මහත්තයත් ඉඳල තියෙන්නේ. ඒ දවස්වල උන්නැහේ තම නම භාවිතා කළේ වෙනස් ලෙසකට නිසා මට අඳුනගන්න බැරි වුණා. එයා මේ ළඟදී පැවැත්වුණ උදලාගම මානව හිමිකම් කොමිසමේ හෙළ උරුමයේ නීතිඥයා ලෙසට පෙනී හිටිය. ඒ අනුව අපේ කාලෙදි වමට වගේම දකුණටත් ආනන්දයට උගතුන් ඇති කළා කියල කියන්න පුළුවන්. මං ආනන්දයට ඇතුළු වෙන කොට විදුහල්පති හැටියට හිටියේ මෙත්තානන්ද මහත්තය. එයා පිලිප් සමඟ සිංහලට බර වාමාංශිකයෙක් හැටියට තමා එදා අදහස් දැක්වූයේ. ඒ වුණත් පාසල තුළ විවිධ අදහස් කථාබහ කරන්නට ඉඩ දීපු නිදහස් වාතාවරණයක් තිබුණා. ඒ වගේම කලාව, සහිත්‍යයට බරවුණ ඇදුරන් ගණනාවක්ම පාසලේ ගුරු සේවයේ හිටිය. වාසනාවකට අපිට සිංහලවලට කැකුළාවල ගුරුතුමන් වසර කිහිපයකට හෝ උපදෙස් ලබා ගන්නට හැකි වුණා. ඒ දවස්වල අනන්දය පුද්ගලික පාසලක්. එය රජයට පවරා ගත්තේ 1962 දි. ඒ වෙන කොට අපි සරසවියට ඇතුළු වෙලා ඉවරයි. පුද්ගලික පාසලක් වුනත් එතරම් ලොකු අය කිරීමක් තිබුණේ නෑ. එසේම පාසැලේ 5 වන වසරට ඇතුල්වීමට ජාතික මට්ටමේ විභායක් පාසල විසින්ම පැවැත්වුවා. ඒ හින්ද තමා ගුරුවරුන් වුණ මගේ දෙමව්පියන්ට තම දරුවා ආනන්දයට දමා ගන්නට පුළුවන් වුණොත්. ආනන්දයේදී මගේ සිතුම් පැතුම්වලට තදින්ම බලපෑව ගුරුවරු දෙන්නෙක් හිටිය. එක්කෙනෙක් ගරු ආචාර්ය කොටගම වාචිස්සර සාදු. වාචිස්සර හාමුදුරුවෝ අපේ සිත්වල ගොඩනැගිල තිබුණ අද්භූතවාදී අනම්මනම් අතුගාල දමල බුදු දහමේ යථාවාදී බව තහවුරු කළා. තර්ක අනුභූතිවාදයෙන් සාමාන්‍ය ලෝකය වටහා ගන්න පුළුවන් වුණත් සැබෑ යථාර්තය එයින් දැනගන්න බෑ. ඒ සඳහා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්ෂණාවලින් ස්වභාවය හැදිල තියෙනව බව හඳුනගෙන ලෝකය දිහා බලන්න ඕන. වෙනස් වන බව, බිඳ වැටෙන බව හා හර සුන් බව යන ලක්ෂණ තුන අඩංගුයි හැම දෙයටම. මෙය තර්ක ඥාණය බිඳගෙන යන දැනුමක්. මේ අනුව මෙනෙහි කිරීම තුළ ලෝකය බැලිය යුතුයි. දැන් මේ දාර්ශනික දැනුම අපට ලැබෙන්නේ සාමාන්‍ය පෙළට බුදු දහම ඉගෙන ගන්නකොට. ඊළඟට උසස් පෙළට යන කොට තමා අපට තනබාලසිංහම් හමු වෙන්නේ. එයා සම සමාජ නායකයෙක් වුණ කරාලසිංහම් ගේ මල්ලී. මම ඉගෙන ගත්තේ ගණිතය, භෞතික විද්‍යාව ආදියයි. එයට පාසලේදීම කිව්වේ ඉංජිනේරු ධාරාව කියල. ඒ වුණාත් භාෂා විෂයයන් අතිරේඛ වශයෙන් කරන්න තිබුණා. තනබාලසිංහම් ආවේ ඒ ඉංග්‍රීසි විෂයය වෙනුවෙන්. එයා ඉංග්‍රීසි ඉගැන්වුවේ මාක්ස්වාදී සාහිත්‍යය අනුසාරයෙන්. මෙයින් මාක්ස්වාදී පතපොත කියවන්නට අපි පෙළඹුණා.

> **මං පෙන්නු හැකියාවන් දැක කෙළින්ම මාව තෝර ගත්ත පිංගුත්තර නාටකයේ පිංගුත්තර චරිතයට. අපට සිංදු ඉගැන්නුවේ අල්ගම සංගීතඥයා. මගේ ගායනය මදි කියල උන්නැහේ කියන්න පටන් ගත්ත. මාත් කියන විදියට මහන්සි වුණත් එයාව සතුටු කරන්න ඒත් බැරි වුණා. ඒ නිසා මගෙන් ඒ චරිතය කැපිල ගාමිණී යාපාට අයිති වණා. එතැනින් මගේ රඟපෑම අවසන් වුණා.**

ඒත් ආනන්දයේදී කලාව ගැන මට උනන්දුවක් ඇති වුණේ නෑ. එවැනි ඉඩක් ලැබුණේ පළමුවෙන්ම සරසවියේ පළවෙනි වසරෙදි. ඒ දවස්වල ඉංජිනේරු පීඨය තිබුණේ කොළඹ. පළවෙනි වසර අපි ගෙව්වේ විද්‍යා පීඨයේ අයත් සමඟයි. ඒ වසර එනිසා බොහොම සැහැල්ලු වුණා. මොකද? ගණිතය, භෞතික විද්‍යාව ආදියේ මූලික දැනුම් උසස් පෙළ මට්ටමෙදීම මං ලබා ගෙන තිබුණ නිසා. එනිසා වැඩි පාඩමක් නැතිවත් පළමු වසර මහ ඉහළින්ම මං සමත් වුණා. මට ඇර ඒ මට්ටම තිබුණේ මහ ඇදුරු රණවීරට පමණයි. ඒ නිසාම ඒ වසර තුළ මං හැම දෙයටම ඇතුල් වෙලා බැලුව. දයානන්ද ගුණවර්ධන නාට්‍ය දෙකක් වෙනුවෙන් රඟපෑමට අය හොයන බව නිවේදනයක දැකල මාත් ගියා තෝරන දවසේ. මං පෙන්නු හැකියාවන් දැක කෙළින්ම මාව තෝර ගත්ත පිංගුත්තර නාටකයේ පිංගුත්තර චරිතයට. අපට සිංදු ඉගැන්නුවේ අල්ගම සංගීතඥයා. මගේ ගායනය මදි කියල උන්නැහේ කියන්න පටන් ගත්ත. මාත් කියන විදියට මහන්සි වුණත් එයාව සතුටු කරන්න ඒත් බැරි වුණා. ඒ නිසා මගෙන් ඒ චරිතය කැපිල ගාමිණී යාපාට අයිති වණා. එතැනින් මගේ රඟපෑම අවසන් වුණා.

1967 ආචාර්ය උපාධිය වෙනුවෙන් පර්යේෂණයට කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයට යන්න මට ඉඩ ලැබුණා. මං පර්යේෂණයට කළේ විද්‍යුත් චුම්භක න්‍යාය පිළිබඳ ප්‍රශ්නයක් හැදෑරීම වුණාත් මට අවශ්‍ය වුණා කලා ක්ෂෙත්‍රයේ යමක් කරන්න. කේම්බ්‍රිජ්වල විශ්ව විද්‍යාලයට අමතරව කලා / තාක්ෂණ පාසැලක් තිබුණා. දැන් ඒකත් වෙනම සරසවියක් වෙලා කියල ආරංචියි. ඒ දවස්වල එය පාසලක්. ඒත් කලා විෂයයන් එතැන ඉගැන්වූව. හවස පංතියකට මාත් අයැදුම්පත් දැම්මහම මට එන්න කියල තිබුණා සම්මුඛ පරීක්ෂණයකට. මං එතැනට යනකොට විශාල පිරිසක් පොරකකා හිටිය. මං හිතුව මට ඉඩක් නැති වෙයි කියල. ඒත් බැළුවහම ඒ ළමයි පොරකෑවේ ෂදඑඑැරහ නැත්නම් මැටි භාජන සෑදීමේ පාඨමාලාවට. මොකද? ඒකට චාර්ල්ස් කුමාරයත් ඇතුල් වෙන්න ආ නිසා. චාල්ස් සරසවියේ උපාධියට පාඩම් කරන අතර මේ වගේ කලා වැඩකටත් අත ගහල තිබුණා. මං ඉල්ලුවේ මූර්ති ශිල්පය. ඒ පරීක්ෂණයෙන් මං ඉහළින් තේරුණා. මොකද? මට සහජ හැකියාවක් තිබුණ නිසා මූර්ති ශිල්පයට. මං ඒ පංතියේ හිටපු ඉහළම සිසුවා හැටියට අපට ඉගැන් වූ මූර්ති ශිල්පිනිය මට සහතිකයකුත් දුන්න. කවුද කියන්නේ මට කලාව ගැන දැනුමක් නෑ කියල?


